පූජ්‍ය අයගම සිරි යසස්සී හිමි
PAPER

**ස්ත්‍රී පුරුෂ ප්‍රේමය ආශ්‍රිත පුද්ගල මනෝභාව හා චර්යා පිළිබඳ බෞද්ධ විග්‍රහය**

**පූජ්‍ය අයගම සිරි යසස්සී හිමි, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය**

මානව සංහතියේ ප්‍රාරම්භක අවදියේ පටන් සර්වව්‍යාපී සමාජ ධර්මතාවයක් ලෙස ස්ත්‍රී පුරුෂ ආශක්තභාවය හා තදායත්ත චර්යා පද්ධතිය හඳුනාගත හැකිය. පුරාතනයේ පටන් පෙරදිග මෙන්ම අපරදිග සාහිත්‍ය ක්ෂේස්ත්‍රයන්හි වස්තු විෂයයන් බොහෝ සෙයින් දිව යන්නේ උක්ත මානව ප්‍රවණතාවය පදනම් කරගෙනය. නූතන මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, ජීව විද්‍යාව ආදී විෂය ක්ෂේස්ත්‍රයන් මගින් ආලය, ආදරය, ප්‍රේමය, ස්නේහය ආදී නාමාන්තරයන්ගෙන් සූචනය වන පුද්ගල මනෝභාව හා චර්යා පිළිබඳ විවිධ නිර්වචන හා නව්‍ය අර්ථකථන ඉදිරිපත්ව ඇත.

ප්‍රස්තුතය පිළිබඳ ආගමික දෘෂ්ටිකෝණයෙන් පරීක්ෂා කර බැලීමේදී ස්ත්‍රී පුරුෂ ප්‍රේමය හුදෙක් පංචේන්ද්‍රිය ප්‍රීණනය හෝ ප්‍රජනන ක්‍රියාවලිය මත පමණක් පදනම් වුවක් නොව ආධ්‍යාත්මික සම්බන්ධතාවයක් මගින් සමාජ සංස්ථාව බිඳ නොවැටී පවත්වාගෙන යාම සඳහා වූ ස්වාභාවික ක්‍රියාවලියක් බව සනාථ වෙයි. බුදුදහම හා බෞද්ධ සාහිත්‍යය ආශ්‍රයෙන් උක්ත කාරණය විග්‍රහ කිරීමේදී ස්ත්‍රී පුරුෂ ප්‍රේමය රාගික ආශක්තභාවයේ එක්තරා පැතිකඩක් වුවද එය අන්‍යොන්‍යාවබෝධය, පරිත්‍යාගශීලී බව හා විශ්වාසය ආදී මනෝභාව සමාන්තරව උද්දීපනය කිරීම මගින් සමාජ සදාචාරය හා පුද්ගල සංවර්ධනය උදෙසා අදාළ වූවක් බව මනාව පැහැදිලි වෙයි.

වර්තමාන ලෝකයේ සියදිවි නසා ගැනීම, මානසික රෝගීන්ගේ සංඛ්‍යානය ප්‍රවර්ධනය වීමලහිංසනය, පීඩනයල පවුල් සංස්ථාව බිඳ වැටීම, මානසික අසහනය ආදි කරුණු රාශියක මූල කාරක හේතුවක් ලෙස ස්ත්‍රී පුරුෂ ප්‍රේමයේ යථාර්ථය හා පරමාර්ථ හඳුනා නොගැනීම දැක්විය හැකිය. බුදුදහම හා බෞද්ධ සාහිත්‍ය මගින් ස්ත්‍රී පුරුෂ ප්‍රේමයේ පරමාර්ථ පර්යේෂණාත්මකව ගවේෂණය කොට ඉදිරිපත් කිරීම මගින් නූතන සමාජගත ගැටලු නිරාකරණය කිරිම හා සදාචාරවත් සමාජ ධර්ම ප්‍රස්තුතයට අඳාලව මතුකර දැක්වීම මෙහිදී අපේක්ෂිතය.